# 5. අපේ පාසල



පුද්ගලයෙකුගේ දියුණුවට මෙන් ම සමාජ දියුණුවට ද හේතුවන පාසල වැදගත් සමාජ ආයතනයකි. ඔබ ඉගෙනුම ලබන පාසල ගමක හෝ නගරයක පිහිටා තිබිය හැකි ය. ප්‍රදේශයේ සිතියමෙන් ඔබ පාසල පිහිටි ගම/නගරය හඳුනාගන්න.

පාසල දරුවන්ගේ ය. සමබර පෞරුෂයක් සහිත පුරවැසියන් බවට ඔබ පත් කර සමාජයට යොමු කරන්නේ පාසල යි. ඔබේ වගකීම වනුයේ එහි ගෞරවය රැක ගනිමින් හොඳින් ඉගෙනීමේ කටයුතුවල යෙදීමයි.

## 5.1 පාසලේ ආරම්භය හා විකාශය

සෑම ආයතනයකට ම ඉතිහාසයක් තිබේ. එනම් සෑම ආයතනයක් ම ආරම්භ වූ දා සිට මේ දක්වා වූ සිදුවීම් විකාශය යි. ඔබේ පාසලට ද ඉතිහාසයක් තිබේ.

**ඔබේ පාසලේ ඉතිහාසය යනුවෙන් අදහස් කරනුයේ පාසල ආරම්භ වූ දා සිට මේ දක්වා විකාශය වූ ආකාරය පිළිබඳ තොරතුරු ය.**

**පාසලේ ඉතිහාසය පිළිබඳ තොරතුරු සොයා ගැනීමේ මූලාශ්‍ර කිහිපයක් පහත දැක්වේ**

- පාසලේ පවත්වා ගෙන යන ලිපි ලේඛන (ලොග් පොත/ සිසුන් ඇතුළත් කිරීමේ ලේඛන/ලකුණු පොත්/සංගණන වාර්තා
- පාසලේ විවිධ ස්ථානවල ඇති සමරු ඵලක
- විශ්‍රාමික විදුහල්පතිවරුන්ගෙන් හා ගුරුවරුන්ගෙන් ලබා ගත හැකි තොරතුරු
- ආගමික ස්ථානවල නායකයන්ගෙන් ලබා ගන්නා තොරතුරු
- ආදි ශිෂ්‍යයන්/ආදි ශිෂ්‍යාවන් ගෙන් ලබා ගත හැකි තොරතුරු
- ප්‍රදේශයේ වෙනත් ප්‍රජා සංවිධානවලින් ලැබෙන තොරතුරු

**ක්‍රියාකාරකම 5.1.1.1**

ජයන්තිපුර මහ විදුහලේ 6 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන අරුණ සිසුවා විසින් පාසලේ බිත්ති පුවත්පතට ''අපේ පාසලේ ඉතිහාසය'' මැයෙන් ඉදිරිපත් කරන ලද වාර්තාවක ඇතුළත් තොරතුරු පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| 01. | පාසල ආරම්භ කළ දිනය | :- | 1916 ජනවාරි 05 |
| 02. | පාසලේ ආදි කර්තෘ | :- | රණබාහු වික්‍රමසූරිය මහතා |
| 03. | ආරම්භක ශිෂ්‍ය සංඛ්‍යාව | :- | 26 |
| 04 | ආරම්භක ගුරුවරුන් සංඛ්‍යාව | :- | 02 |
| 05. | ආරම්භක ගොඩනැගිලි සංඛ්‍යාව | :- | 01 |
| 06. | ශ්‍රේණි සංඛ්‍යාව | :- | 05 |
| 07. | මහා විද්‍යාලයක් බවට පත් වූ දිනය | :- | 1960.10.08 |

ඔබේ පාසලේ ආරම්භය අවස්ථාවේ පැවති තත්ත්වය හා වර්තමානයේ පවතින තත්ත්වය පිළිබඳ තොරතුරු එක් රැස් කොට පහත වගුව සම්පූර්ණ කරන්න.

| | ආරම්භයේ දී (දිනය) | වර්තමානයේ දී (දිනය) |
|---|---|---|
| ගොඩනැගිලි | | |
| ශිෂ්‍ය සංඛ්‍යාව | | |
| ගුරු සංඛ්‍යාව | | |
| පන්ති සංඛ්‍යාව | | |
| ආගමික ස්ථාන | | |
| ක්‍රීඩා පිටිය | | |
| පුස්තකාලය | | |
| විද්‍යාගාරය | | |
| ගෘහ විද්‍යාගාරය | | |
| බහුකාර්ය ගොඩනැගිල්ල | | |
| ලී වැඩ ඒකකය | | |
| ප්‍රධාන ශාලාව | | |
| ගුරු නිවාස | | |
| පරිගණක ඒකක | | |


**ක්‍රියාකාරකම 5.1.2**

- ඔබ පාසලේ දීප්තිමත් ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන් පිළිබඳ සොයා බලා ඔවුන්ගෙන් පාසලේ කීර්තිනාමයට සිදුවූ දායකත්වය අගය කරන්න.

## 5.1.2 පාසලේ සංවිධාන ව්‍යුහය

පාසලක විධිමත් බව හා වැඩ කටයුතු පවත්වා ගෙන යාමේ පහසුව සඳහාත් පාසල විසින් ඉටු කළ යුතු සමාජ මෙහෙවර සාර්ථක කර ගැනීම සඳහාත්, ගොඩ නගා ඇති සංවිධාන රටාව පාසලේ සංවිධාන ව්‍යුහය ලෙස හැඳින්වෙයි. ඔබේ පාසලේ එවැනි සංවිධාන ව්‍යුහයක් පවතී.

**පාසලක සංවිධාන ව්‍යුහය දැක්වෙන ආදර්ශ සටහනක් පහත දැක්වේ.**






නොමිලේ බෙදාහැරීම පිණිසයි.

මෙම සංවිධාන ව්‍යුහය එක් එක් පාසල් වර්ග අනුව වෙනස් විය හැකිය.

| ශ්‍රී ලංකාවේ පාසල් වර්ග හතරක් ඇත | | |
|---|---|---|
| 3 වර්ගය | - | 1 - 5 දක්වා ශ්‍රේණි සහිත පාසල් |
| 2 වර්ගය | - | 1 - 11 දක්වා ශ්‍රේණි සහිත උසස් පෙළ රහිත පාසල් |
| 1 C වර්ගය | - | උසස් පෙළ කලා/වාණිජ විෂයධාරා පමණක් ඇති පාසල් |
| 1 AB වර්ගය | - | උසස් පෙළ විද්‍යා අංශ සහිත පාසල් |
| ❇ ඉහත වර්ග අතුරින් ඔබේ පාසල අයත් කුමන වර්ගයට දැයි හඳුනා ගන්න. | | |

**ක්‍රියාකාරකම 5.1.2.1**

01. ඔබේ පාසලේ සංවිධාන ව්‍යුහය සටහනකින් නිරූපණය කරන්න.
02. ඔබේ පාසලේ ක්‍රියාත්මක වන සමිති කිහිපයක් නම් කරන්න.




## 5.1.3 පාසල් සමාජය

ඔබේ පාසල් සමාජය සමන්විත වන්නේ විවිධ පවුල් ඒකකවලින් පැමිණෙන සාමාජිකයන්ගෙනි. පවුල නමැති කුඩා සමාජ ඒකකයේ සාමාජිකයකු වූ ඔබ පාසල් සමාජයේ ද සාමාජිකයෙකි. ඔබේ පාසල බාලක පාසලක්/බාලිකා පාසලක් හෝ මිශ්‍ර පාසලක් විය හැකි ය. එහි විවිධ ජන වර්ගවලට අයත් සිසුන් සිටිය හැකි ය. විවිධ ආගම් අදහන අය සිටිය හැකි ය. පාසලේ දී ඔවුන් සියලු දෙනා ම එකමුතු ව සහෝදරත්වයෙන් ක්‍රියා කරති. සැබැවින් ම අපේ දිවිමගට ආලෝකයක් ලබා ගෙන පාසල් සමාජය තුළින් එකමුතු ව සහෝදරත්වයෙන් බැඳී සිටිමින් අනාගතයේ දී රටට දැයට පමණක් නො ව ලොවට වැඩදායී පුරවැසියන් වීම අපගේ අරමුණ විය යුතු ය.

**ක්‍රියාකාරකම 5.1.3.1**

❇ පාසල් සමාජයේ දී තුළ ඔබ සියලු දෙනා එකමුතු ව කටයුතු කරන අවස්ථාව කිහිපයකට උදාහරණ දක්වන්න.

## 5.1.4 පාසල් සංස්කෘතිය

විනයගරුක සමාජයක සමාරම්භය පාසලයි. පාසලේ අනන්‍යතාව, සම්ප්‍රදයයන්, නීති රීති පාසලේ සංස්කෘතිය ලෙස හැඳින්වේ.

ඔබට පාසලේ දී නිවසේ දී මෙන් හැසිරිය නොහැකි ය. පාසලේ නීති රීති ආචාර ධර්ම හා සම්ප්‍රදායයන් පවතී. ඔබ පාසලේ දී හැසිරිය යුත්තේ ඒවාට අනුකූල ව ය.

- ✶ පාසල හා බැඳී ඇති ආගමික හා සංස්කෘතික සම්මතයන්ට අනුගත විය යුතු ය.
- ✶ ආචාරශීලී ලෙස හැසිරීම ඉතා වැදගත් ය.



නොමිලේ බෙදාහැරීම පිණිසයි.

- පන්තියෙන් බැහැරව යාමට ගුරුතුමාගේ හෝ ගුරුතුමියගේ අවසර පතයි.
- විදුහල්පති/විදුහල්පතිනිය, ගුරුතුමා/ගුරුතුමිය හෝ පාසලේ ආචාර්ය මණ්ඩලයේ සාමාජිකයකු පන්තියට පැමිණි විට නැගිට ආචාර කරයි.
- පාසලට ශිෂ්‍ය ශිෂ්‍යාවන් පැමිණෙන්නේ නිල ඇඳුමෙනි.
- පාසල ආරම්භ කරන්නේත්, අවසාන කරන්නේත්, කාල පරිච්ඡේද වෙන් කරන්නේත්, නියමිත කාලසටහනකට අනුව ය.
- ගුරුවරුන්ට කීකරු වීම.
- පන්තිය හා අවට පිරිසිදු කිරීම, යහජීවන පුරුදු තුළින් අලංකාරවත් පරිසරයක් පවත්වාගෙන යාම.
- ශිෂ්‍ය නායක නායිකාවන්ට අවනත වීම.
- පාසල් උපකරණ හා ගොඩනැගිලි ප්‍රයෝජනයට ගැනීම හා ආරක්ෂා කිරීම.
- පාසල තුළදීත් ඉන් පිටතදීත් සුහද හා සංවරශීලී ලෙස කථා කිරීම.




**ක්‍රියාකාරකම 5.1.4.1**

- ඔබ පාසලේ ක්‍රියාත්මක වන නීති රීති හා සම්ප්‍රදායයන් ලියා පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.

## 5.1.5 පාසලේ අනන්‍යතාව

අනන්‍යතාව යනු අන්‍යයන්ගෙන් සුවිශේෂී ව හඳුනා ගැනීමයි. පාසලේ සිසුන් අතරින් ඔබ වෙන් කොට හඳුනා ගත හැකිවන පරිදි ඔබට නමක් තබා ඇත්තේ ඔබේ අනන්‍යතාව වෙනුවෙනි. ශ්‍රී ලංකාවේ පාසල් අතරින් ඔබේ පාසලට වෙන් වූ අනන්‍යතාවක් තිබේ.




**ඔබේ පාසලට පාසල් ගීයක් ඇත. පාසල් ගීතය ඔබේ පාසලේ අභිමානයයි. පාසලට මවකට මෙන් සැලකීම, ගෞරව කිරීම, සිසුන්ට දැනුම, ගුණධර්ම කියාදීම, සමගියෙන් මව්බිම සුරැකීම වැනි හැඟීම් පාසල් ගීය තුළ අන්තර්ගත වේ. පාසල් ගීයට ගෞරව දැක්වෙන සේ හැසිරීම ඔබ සතු යුතුකමක් වේ.**




නොමිලේ බෙදාහැරීම පිණිසයි.

**ක්‍රියාකාරකම 5.1.5.1**

- ඔබේ පාසලේ නම, පාසල් ලාංඡනය, පාසල් ධජය, පාසල් ගීතය, ආදර්ශ පාඨය, මෙහෙවර ප්‍රකාශය ඇතුළත් කොට ප්‍රදර්ශන පුවරුවක් සකස් කරන්න.
- පාසල් ගීයේ අන්තර්ගතය තුළින් ඔබේ සිතට නැගෙන සිතුවිලි චිත්‍රයට නගන්න.
- ගුරුතුමාගේ/ගුරුතුමියගේ උපදෙස් අනුව ඔබේ පාසලේ අනන්‍යතාව පිළිබිඹු කරන අංග වල අර්ථය සාකච්ඡා කරන්න.

## 5.1.6 පාසල් සාමාජිකයන්ගේ වගකීම් හා යුතුකම්

ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක වශයෙන් පාසලෙන් ඔබට ලැබෙන දේ පිළිබඳ ව සිතන්න.




ඔබ පාසලෙන් මෙම දායාද ලබා ගැනීමේ දී පාසලේ අනෙකුත් සාමාජිකයන්ටත් පාසලටත් අවහිරතා ඇති නො වන පරිදි කටයුතු කිරීම ඔබේ වගකීමයි. ඔබේ පාසල නඩත්තු කිරීමට උදව් කිරීම, පිරිසිදු ව තබාගැනීම, සම්ප්‍රදායන් පිළිපැදීම, පෙළපොත් සුරක්ෂිත ව පරිහරණය කිරීම, පුස්තකාල පොත් සුරැකීම ඔබගේ යුතුකමයි.

**පාසලේ ගෞරවණීය නාමය සුරක්ෂිත කිරීම ඔබේ වගකීමයි.**

**ක්‍රියාකාරකම 5.1.5.2**

- පාසලේ ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක වශයෙන් ඔබේ යුතුකම් හා වගකීම් හඳුනාගෙන පහත වගුව සම්පූර්ණ කරන්න.

| පාසල් සමාජයේ සාමාජිකයෙක් ලෙස ඔබේ වගකීම | පාසල් සමාජයේ සාමාජිකයෙක් ලෙස ඔබේ යුතුකම |
|---|---|
| | |

## 5.1.7 පාසලෙන් සිදුවන සේවය

ඔබට අධ්‍යාපනය ලබා දීම පාසලෙන් සිදුවන ප්‍රධාන සේවයයි. එමෙන් ම යහපත් පුරවැසියකු බවට පත් කිරීමට අවශ්‍ය මඟපෙන්වීම විධිමත් ව දෙනු ලබන්නේ පාසලෙනි. පාසලෙන් සිදුවන සේවය පිළිබඳ ව දැක්වෙන පහත සටහන අධ්‍යයනය කරන්න.



නොමිලේ බෙදාහැරීම පිණිසයි.




**පාසලෙන් සිසුනට සිදුවන සේවය.**

- ✶ දැනුම ලබා දීම.
- ✶ චරිත සංවර්ධනය.
- ✶ නායකත්වය පුහුණු කිරීම.
- ✶ යහපත් ජීවන පුරුදු ඇති කිරීම.
- ✶ විනය ගරුක පුද්ගලයකු බවට පත් කිරීම.
- ✶ දක්ෂතා එළි දැක්වීමට අවස්ථා උදා කිරීම.

**පාසලෙන් දෙමව්පියන්ට සිදුවන සේවය.**

- ✶ තම දරුවන්ට අධ්‍යාපනය ලබා දී යහපත් ජීවිතයක් ගත කිරීමට මඟ පෙන්වීම.
- ✶ දරුවන්ට අනාගත රැකියා අවස්ථාවන්ට අවශ්‍ය මූලික සුදුසුකම් ලබා දීම.
- ✶ විභාග සමත් වීම සඳහා මඟ පෙන්වීම.

**පාසලෙන් රජයට සිදුවන සේවය.**


- ✶ යහපත් පුරවැසියන් බිහි කිරීම.
- ✶ ජනතාවගේ සාක්ෂරතාව වැඩි දියුණු කිරීම.
- ✶ අනාගත නායකයන් පුහුණු කිරීම.
- ✶ රජයේ අපේක්ෂා හා අරමුණු ඉටු කරන ආයතනයක් වීම.

**වෙනත් ආයතන හා සංවිධානවලට පාසලෙන් සිදුවන සේවය.**

- ✶ තම ආයතනවල අරමුණු ඉටු කර ගැනිම මාධ්‍යයක් ලෙස යොදා ගැනීම. (සෞඛ්‍ය සේවා/පරිසර සංරක්ෂණය/පොලිස් නිලධාරීන් දැනුවත් කිරීම.
- ✶ පොලිස් නිලධාරීන් කරන දැනුවත් කිරීම.
- ✶ යුනෙස්කෝ, යුනිසෙෆ් වැනි ජාත්‍යන්තර ආයතන පාසල තුළින් තම සුභසාධන සේවා ක්‍රියාත්මක කිරීම.

## 5.1.8 පාසල සහ සමාජය අතර සම්බන්ධතා

පාසල ඔබට පමණක් නො ව සමාජයට ද විවෘත ස්ථානයකි. පාසල ඉටු කරන්නේ ප්‍රදේශවාසීන්ගේ අවශ්‍යතාවන් ය. පාසලෙන් සමාජයටත්, සමාජයෙන් පාසලටත් සේවය සැලසෙයි.




මේ සියලු සබඳතා එම අංශවලටත්, පාසලටත් අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රයෝජනවත් වේ.